## කො/දේවි බාලිකා විද්‍යාලය - කොළඹ

## පළමු වාර පරීක්ෂණය - 2016

## නාට්‍ය හා රංග කලාව

6 ශ්‍රේණිය

කාලය පැය 1 1/2

### I කොටස

ප්‍රශ්න සියල්ලටම පිළිතුරු සපයන්න.

නිවැරදි පිළිතුර තෝරා යටින් ඉරක් අඳින්න.

01. ජන කථාවල දකින්නට ලැබෙන දෙයකි,
    (i) විවිධ චරිත පිළිබඳව විවරණය
    (ii) මුල, මැද, අග සම්බන්ධයක් නොතිබීම
    (iii) ගැමි බසින් නිර්මාණය වී තිබීම
    (iv) රස වින්දනයක් ලබා දීම

02. මේ අතරින් ජන කථාවක් නොවන්නේ,
    (i) සින්ඩරෙල්ලාගේ කථාව (ii) ඌරු දඩයමේ ගිය ගම හාමිනේ
    (iii) අහස කඩා වැටේ (iv) ගම දෝණිගේ චාරිත්තරේ

03. පෙර සූදානමකින් තොරව කරන නිරූපනය හඳුන්වනනේ,
    (i) අභිරූපණය (ii) ක්ෂණික නිරූපණය
    (iii) චරිත නිරූපණය (iv) අනුකරණය

04. පහත දැක්වෙන චරිත අතුරින් ළමා නාට්‍යක් වන්නේ,
    (i) නරි බෑණා (ii) හිම කුමාරි
    (iii) තලමල පිපිලා (iv) බල්ලොත් එකක් බෑ

05. ස්වාභාවික පරිසරයේ අපට දකින්නට නොලැබෙන දෙයකි,
    (i) යන්ත්‍ර සූත්‍ර (ii) ගහ කොළ
    (iii) අහස පොළව (iv) සතා සිවුපාවා

The National e-learning Portal for The General Education

06. කටවහරේ එන බොහෝ දේ ඇසුරෙන් නිර්මාණය වූ කතන්දර වන්නේ,

(i) ඉතිහාස කථා (ii) නව කථා

(iii) ජන කථා (iv) ආගමික කථා

07. නාට්‍යයක දෙබස් සංවාද තුළින් ප්‍රේක්ෂකයාට නොලැබෙන දෙයකි,

(i) රසවින්දනය (ii) සංගීතය

(iii) චරිත වටහාගැනීමට (iv) ආදර්ශයක් ලාබදීම

08. වේදිකා නාට්‍යක් සඳහා අත්‍යාවශ්‍ය නොවන දෙයකි,

(i) සංගීතය (ii) රංගාලෝකය

(iii) තාක්ෂණික කැමරා උපකරණ (iv) රංග භාණ්ඩ

09. "ඇහැළ මලින් ගස් පිරිලා" ගීතය අයත්වන්නේ,

(i) නාට්‍ය ගීතයකි (ii) චිත්‍රපට ගීතයකි

(iii) දේශාභිමානී ගීතයකි (iv) විරිදුවකි

10. වනාන්තරේ ඔබ යනවිට සිංහයෙකු දැකීමෙන් ඔබට ඇති වන්නේ,

(i) සතුටකි (ii) දුකකි

(iii) භයකි (iv) පිළිකුලකි

- පහත සඳහන් වන්නේ ජන කතාවලට අයත් කොටස් කිහිපයකි, එහි සඳහන් ඉංග්‍රීසි අක්ෂරය අදාල ජන කතාවේ නමට ඉදිරියෙන් ලියන්න.

A - කාලයා තෑගි බෝගත් අරගෙන බොහෝම සන්තෝසෙන් ගෙදර ආවා, ඉතින් කාලයා මෙන්ම ගම මහගෙත් ඉතාම සතුටට පත්වුණා, එදා ඉඳලා මේ ගම ගෙදර කිරියෙන් පැණියෙන් ඉතිරුණා

B - " දෙවියන් වහන්ස ගැත්තාට අනුකම්පා කරන සේක්වා, මේක නම් කකුල්හතරේ සතෙකුගේ නාඩියක් මිසක් මනුස්ස සරීරෙක නාඩියක් වෙන්න බැහැ"

C - මල්ලියේ ඔහොම නොකරන් අපේ | අම්මාට
දෙතනේ කිරි දුන්නේ අපි | දෙන්නාට
තියෙන දෙයක් දෙන්නෙන් අපි | දෙන්නාට

The National e-learning Portal for the General Education

D - ඇටිකිති චූස් - කකුළු චරස්

හාවා කළ එකෙල මෙකෙල

E - සීනුව නාද කරමින් පොළ පුරා ඇවිද්ද ගමරාළට සෙනග අතර ඉන්න හොරා සොයාගන්න ලැබුනේ ගම රාළගේ නුවණ නිසා

| | | |
|---|---|---|
| 11. | බුදුන්වදින ලෙස වැදපන් අම්මාට | |
| 12. | අනූන්ට කැපු වලේ තමන්වැටිම | |
| 13. | හීල්බත දත්කුඩ | |
| 14. | නාඩි බැලීම | |
| 15. | පුහුල් හොරා කරෙත් දැනේ | |

(15×2 = 30)



e තක්සලාව The National e-learning Portal for The General Education

## II කොටස

පහත දැක්වෙන ප්‍රශ්නවලින් 03 ක් තෝරාගෙන පිළිතුරු ලියන්න.

01. (i) ස්වාභාවික පරිසරයේ ඇති සිද්ධි නාට්‍යානුසාරයෙන් කර පෙන්විය හැකි අවස්ථා 05 ක් ලියන්න. (ලකුණු 05)

(i) ස්වාභාවික පරිසරයෙන් නිර්මාණය නොවුනු මිනිසුන් විසින් නිර්මාණය කල දේවල් 05 ක් ලියන්න. (ලකුණු 05)

02. (i) ක්ෂණික නිරූපනයක් යනු කුමක්ද? (ලකුණු 05)

(ii) සත්ව චරිතයක් රඟ පෑමේදී අපට එම සතාගේ විලාසය පෙන්වීමට කල හැකි දේවල් මොනවාද? (ලකුණු 05)

03. (i) සමාජයේ වෙසෙන මිනිසුන්ගේ ඔබ දකින වෙනස්කම් 05ක් ලියන්න. (ලකුණු 05)

(ii) ඔබ සිත්ගත් ඕනෑම මිනිස් චරිතයක් ඇඳ නම් කරන්න. (ලකුණු 05)

04. (i) ඔබ දන්නා ජන කථාවක් කෙටියෙන් ලියන්න. (ලකුණු 05)

(ii) ජනකථාවේ නම, ප්‍රධාන චරිතය හෝ චරිත, එම ජනකථාවෙන් ඔබට ලැබෙන උපදේශ වෙනම ලියන්න (ලකුණු 05)

The National e-learning Portal for The General Education